# නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය

## සංශෝධිත විෂය නිර්දේශය

## 10 වන ශ්‍රේණිය

## I - වාරය

තාක්ෂණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව
විද්‍යා හා තාක්ෂණ පීඨය
ජාතික අධ්‍යාපන ආයතන
මහරගම
ශ්‍රී ලංකාව www.nie.lk

## හැඳින්වීම

2022 වර්ෂයේ ජූලි මස පාසල් නැවත ආරම්භ වීමෙන් පසු සතියකට දින තුනක් පාසල් පැවැත්වෙන අතර එම කාලය තුළ පළමුවන වාරය සඳහා තව දින 21 ක් ද, දෙවන වාරය සඳහා දින 30ක් ද, සහ තෙවන වාරය සඳහා දින 30ක් ද වන ලෙස පාසල් පැවැත්වීමට තීරණය කර ඇත. ඒ අනුව 2022 වර්ෂය සඳහා පාසල් පැවැත්වෙන සම්පූර්ණ දින ගණන දින 81 ක් වේ. පාසල් කාලයේ දී කාලසටහනේ ලබා දෙන කාලච්ඡේද සහ පාසල් නොපැවැත්වෙන සතියේ ඉතිරි දින දෙකේ දී පැවරුම් සහ වෙනත් ස්වයං-අධ්‍යයන ක්‍රියාවලි මගින් සිසුන්ට විෂය කරුණු ආවරණය කිරීමට යෝජිත ය.

ඒ අනුව 2022 වර්ෂයේ දී පළමු වාරය සඳහා මෙතෙක් පැවැත්වූ දින 21 තුළ සම්පූර්ණ කර ඇති කාලච්ඡේද 12ක් ද සමග තාක්ෂණික විෂයයන්ට පළමු වාරයේ දී කාලච්ඡේද 24ක් ද, දෙවන වාරය හා තුන්වන වාරය සඳහා කාලච්ඡේද 18 බැගින් 36ක් ද වන පරිදි සමස්ත කාලච්ඡේද සංඛ්‍යාව 60කි.

දැනට ක්‍රියාත්මක වන විෂය නිර්දේශය භාවිත කරමින් එම කාලච්ඡේද 60 තුළ ඉගෙනුම් ඉගෙන්වීම ක්‍රියාවලියේ යෙදීමට හැකි වන පරිදි නිපුණතා, නිපුණතා මට්ටම්, අන්තර්ගතය, ඉගෙනුම් පල සහ කාලපරිච්ඡේද සංශෝධනය කර මේ සමඟ ඉදිරිපත් කර ඇත. මෙහි දැක්වෙන නිපුණතා, නිපුණතා මට්ටම්, අන්තර්ගතය සහ ඉගෙනුම් පල පමණක් පාසල් පවත්වන දින 81 තුළ ඉගෙනුම් ඉගෙන්වීමේ ක්‍රියාවලිය සඳහා යොදා ගත යුතු බව මෙයින් අවධාරණය කෙරේ.

## 2022 වර්ෂයේ අහිමි වූ කාලය සඳහා ප්‍රතිසාධන සැලැස්ම (**Recovery Plan for Learning Loss - 2022**)

## - 10 ශ්‍රේණිය

(10 ශ්‍රේණියේ පළමු වාරයේ කාලච්ඡේද 24 ක් ද දෙවන හා තෙවන වාරවල කාලච්ඡේද 18 ක් ද බැගින් කාලච්ඡේද 60 ක් සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පවත්වාගෙන යාමට මෙම සැලැස්ම සකස් කර ඇත.)

| **නිපුණතාව** | **නිපුණතා මට්ටම** | **ඉගෙනුම් පල** | **විෂය අන්තර්ගතය** | **ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය / පිටු අංකය** | **පෙළ පොතේ පාඩමේ අංකය සහ නම** | **කාලච්ඡේද ගණන** |
|---|---|---|---|---|---|---|
| 10 ශ්‍රේණිය පළමු වන වාරයෙන් තෝරා ගත් ඉගෙනුම් පල සහ පාඩම් | | | | | | |
| ඉදිකිරීම් ක්ෂෙත්‍රයේ ඇති අවශ්‍යතා ව හා ව්‍යාප්තිය පිළිබඳව විමසා බලයි | 1.1 ඉදික් රීම් ක්ෂෙත්‍රයේ ඇති අවශ්‍යතා ව පැහැදිලි කරයි. | • පුරාණ ඉදිකිරීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• ලොව දියුණුව සමඟ ඉදිකිරීම් ක්ෂෙත්‍රයේ වර්ධනය හා ඉංජිනේරුමය කාර්යයේ අවශ්‍යතාව හා වැදගත්කම විස්තර කරයි.<br>• ඉදිකිරීම් ක්ෂෙත්‍රයේ සිදු වූ විකාශය පිළිබඳව විස්තර කරයි. | • පුරාණ ඉදිකිරීම්<br>• නවීන ඉදිකිරීම්<br>• ඉදිකිරීම් ක්ෂේත්‍රයේ විකාශය<br>• ඉදිකිරීම් සඳහා ඇති ප්‍රවණතා | පිටු අංක 01-02 | පාඩම 1<br><br>ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ව්‍යාප්තිය | ~~2~~ |
| | 1.2 නූතන ලෝකයේ ඉදිකිරීම් ක්ෂෙත්‍රයේ ප්‍රවණතා, හා විශ්මිත | • ඉදිකිරීම් ක්ෂෙත්‍රයේ ශීඝ්‍ර වර්ධනය පිළිබඳව කරුණු දක්වයි. | • පැරණි හා නූතන ඉදිකිරීම් සම්බන්ධ<br>  • ඡායාරූප | පිටු අංක 03-04 | පාඩම 1<br><br>ඉදිකිරීම් ක්ෂේත්‍රයේ | ~~3~~ |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | ඉදිකිරීම් පිළිබඳ කරුණු දක්වයි. | • ඉංජිනේරුමය සාධක/කරුණු ඉදිකිරීම් කටයුතුවල දී භාවිත කර ඇති ආකාරය විස්තර කරයි. | • DVD දර්ශන<br>• ආකෘති<br>• අන්තර්ජාල වාර්තා | | ව්‍යාප්තිය | |
| මෙම 1.1, 1.2 නිපුණතා මට්ටම් 2021 වර්ෂයේ පාසල් පැවැති කාල සීමාව තුළ දී සම්පූර්ණ කර ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව, මෙම නිපුණතා මට්ටම් සංශෝධන විෂය නිර්දේශයෙන් ඉවත් කිරීමත් සිදු නොවන අතර ඒ සඳහා නැවත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වෙනුවෙන් කාලච්ඡේද වෙන්කර නොමැත. එහෙත් ඉදිරි ඇගයීම කටයුතුවල දී ඇගයීමට භාජනය කිරීමට සුදුසු බව නිර්දේශ කෙරේ | | | | | | |
| 2. ඉදිකිරීම් ක්ෂෙත්‍රයේ නිමැවුම්වලට යොදා ගන්නා ද්‍රව්‍යවල තිබිය යුතු ගුණාංග හා පිරිවිතර අනුව ද්‍රව්‍ය තෝරයි. | 2.2 ඉදිකිරීම් ක්ෂෙත්‍රයේ උපයෝගී කරගන්නා ද්‍රව්‍ය හා ඒවායේ ගුණ ප්‍රකාශ කරයි. | • අවශ්‍ය ගුණ අනුව ද්‍රව්‍ය තේරීමට උත්සුක වෙයි. | • ද්‍රව්‍යවල ගුණ හා තොරතුරු අඩංගු වාර්තා<br>- ආතතිය<br>- සම්පීඩනය<br>- විරූපණය<br>- ප්‍රත්‍යාස්තතාව<br>- භංගුරතාව<br>- විලයනීයතාව<br>- සුවිකාර්යයතාව<br>- ආතන්‍ය ප්‍රබලතාව | පිටු අංක 07-08 | පාඩම 2<br><br>ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නිමවුම්වලට යොදා ගන්නා ද්‍රව්‍යවල තිබිය යුතු ගුණාංග | 3 |
| 3.ඉදිකිරීම් සඳහා යොදාගන්නා ද්‍රව්‍ය කීපයක දෝෂ හා ඒවා ඇති වීමට බලපාන හේතු පෙන්වා දී ඒවා වලක්වා ගැනීමේ ක්‍රම ඉදිරිපත් කරයි | 3.1 දෝෂ සහිත ඉදිකිරීම් ද්‍රව්‍ය භාවිතය නිසා නිමවුමට ඇතිවිය හැකි බලපෑම් පැහැදිලි කරයි. | • ඉදිකිරීම් ද්‍රව්‍යවල ඇති විය හැකි දෝෂ නම් කරයි.<br>• එම දෝෂ සහිත කොටස් වෙන් කර පෙන්වා දෙයි.<br>• දෝෂ සහිත කොටස් භාවිතයෙන් සිදු විය හැකි ආපදා /දුර්වලතා පෙන්වා දෙ යි. | • දැව දෝෂ - කොස්ස, දිරුම, පළුදු ගැට, ඇඹරුම<br>• කොන්ක්‍රීට්වල හටගන්නා දෝෂ<br>• ගඩොල්වල දෝෂ<br>• සමාහාරවල ඇති දෝෂ<br>• වෙනත් ඉදිකිරීම් ද්‍රව්‍යවල දෝෂ | පිටු අංක 09-10 | පාඩම 3<br><br>ඉදිකිරීම් සඳහා යොදා ගන්නා ද්‍රව්‍ය හා ඒවායේ ඇතිවිය හැකි දෝෂ | 3 |
| | 3.3 නිමවුමක් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය තෝරා ගනියි. | • ඒ ඒ ද්‍රව්‍යයේ ගුණ විස්තර කරයි.<br>• කාර්යයට ගැළපෙන ද්‍රව්‍යය ම තෝරයි. | • දැව - ගඩොල්<br>• සමාහාර - සිමෙන්ති<br>• හුණු<br>• ඇලුමිනියම් දඬු<br>• යකඩ<br>• ආදේශක ද්‍රව්‍ය<br>• වෙනත් ද්‍රව්‍ය | පිටු අංක 13-14 | පාඩම 3<br><br>ඉදිකිරීම් සඳහා යොදා ගන්නා ද්‍රව්‍ය හා ඒවායේ ඇතිවිය හැකි දෝෂ | 3 |
| | 3.4 නිපැයුම් සඳහා යොදාගන්නා ද්‍රව්‍යවලට සිදුවිය හැකි හානි වලක්වා | • නිෂ්පාදන කාර්යයට යොදා ගන්නා ද්‍රව්‍යවලට ඇතිවිය හැකි දෝෂ වලක්වා ගැනීමේ ක්‍රම පැහැදිලි කරයි. | • දැව සංරක්ෂණ ක්‍රම<br>• දැව පදම් කිරීම | පිටු අංක 15-16 | පාඩම 3<br><br>ඉදිකිරීම් සඳහා යොදා ගන්නා | 2 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | ගැනීමේ ක්‍රම පෙන්වා දෙයි. | | | | ද්‍රව්‍ය හා ඒවායේ ඇතිවිය හැකි දෝෂ | |
| | 3.5 සුලබ ද්‍රව්‍ය භාවිත කර නිමවුමක් ඉදිරිපත් කරයි. | • අවශ්‍යතාව අනු‍ව සැලසුම් සකස් කරයි.<br>• සැලසුමෙහි සඳහන් කොටස්වලට අවශ්‍ය ද්‍රව්‍ය රැස් කරයි.<br>• සැලසුමට අනුව කාර්යය කර නිමා කරයි | • සැලසුම් සකස් කිරීම<br>• ද්‍රව්‍ය රැස් කිරීම<br>• කොටස් එකලස් කර නිමා කිරීම | පිටු අංක 17-18 | පාඩම 3<br><br>ඉදිකිරීම් සඳහා යොදා ගන්නා ද්‍රව්‍ය හා ඒවායේ ඇතිවිය හැකි දෝෂ | 5 |
| 5. ආවුද, උපකරණ නිමවුම් හා පුද්ගල ආරක්‍ෂාව ද නඩත්තු කටයුතු අවශ්‍යතා පිළිබඳව ද සැලකිලිමත් වෙයි. | 5.1 ආවුද උපකරණ හා නිමවුම්වල ආරක්‍ෂාවට බලපාන කරුණු පැහැදිලි කරයි. | • ආවුද හා උපකරණ නියමිත ස්ථානවල ස්ථාන ගත කරයි.<br>• සම්මත ශිල්පීය ක්‍රම අනුගමනය කරයි<br>• ආවුද හා උපකරණ නිවැරදිව භාවිත කරයි<br>• නිමවුම් විධිමත්ව ස්ථානගත කරයි<br>• පුද්ගල ආරක්‍ෂාවට බලපාන කරුණු පැහැදිලි කරයි. | • ස්ථානගත කිරීමේ දී<br>• ශිල්පීය ක්‍රම අන ගමනය කිරීමේ දී<br>• අව භාවිත කිරීමේ දී<br>• නිමවුම් ක්‍රමවත්ව ස්ථානගත කිරීම<br>• පුද්ගල ක්‍රියාකාරකම්වල දී | පිටු අංක 21-22 | පාඩම 5<br><br>ආවුද, උපකරණ, නිමැවුම්, පුද්ගල ආරක්ෂාව හා නඩත්තු කටයුතු | 3 |
| | | | | | සමස්ත එකතුව | 24 |